# පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
## කැලණිය විශ්වවිද්‍යාලය





## සත්ත්වපුරාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2024
## Diploma in Zooarchaeology 2024

සත්ත්ව පුරාවිද්‍යාවේදී මූලික වශයෙන් අධ්‍යයනය කෙරෙනුයේ පුරාවිද්‍යාත්මක වාසස්ථාන කැණීම් කොට අනාවරණය කර ගත් සත්ත්ව අවශේෂයන් පිළිබඳවය. එහි මූලික පරමාර්ථය වනුයේ මානවයා සහ පරිසරය අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාවය අවබෝධ කර ගැනීමත්, විශේෂයෙන් මානවයා සහ අනෙකුත් සත්ත්ව ගණයන් පිළිබඳව අදහසක් ලබා ගැනීමත්ය. සත්ත්වපුරාවිද්‍යාව විෂය ක්ෂේත්‍ර බොහොමයක විවිධත්වය මත රඳාපවතින අතර එහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු විෂයන් ලෙස පුරාවිද්‍යාව, භෞතික විද්‍යාව, ජීවවිද්‍යාව, පරිසර විද්‍යාව හා මානව විද්‍යාව යන විෂයන්වල වූ සංකල්ප හා ක්‍රමවේදයන් නිරන්තරයෙන් යොදාගනු ඇත. සත්ත්ව පුරාවිද්‍යාවේ න්‍යායාත්මක පාර්ශවය මුළුමනින්ම පාහේ රැඳී ඇත්තේ ඉහත දක්වන ලද විෂයන් අනුසාරයෙනි.

පාඨමාලාවේ කාලය - මාස 12
පාඨමාලාවේ ආරම්භය - **2024** සැප්තැම්බර්
අවම ප්‍රවේශ සුදුසුකම් - අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස්පෙළ සමත්වීම හෝ පර්යේෂණ පළපුරුද්ද (පුරාජෛවවිවිධත්ව ඩිප්ලෝමාධාරීන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ)
පාඨමාලා මාධ්‍ය - සිංහල/ඉංග්‍රීසි
දේශන පැවැත්වීම - දේශන සෑම සිකුරාදා දිනකම පෙ.ව.**9.30** සිට ප.ව. **4.30** දක්වා
පාඨමාලාව විෂයන් 05 කින් හා විභාග වාර 02 කින් සමන්විතය.

පාඨමාලා ගාස්තුව - රු. **50,000.00** කි/ ලියාපදිංචි ගාස්තුව රු. **1,500.00** කි

## පුරාජෛවවිවිධත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2024
## Diploma in Palaeobiodiversity 2024

පුරාජෛවවිවිධත්වය යනු අතීතයේ පැවති භූ යුග, සත්ත්ව හා ශාක ෆොසිල, පැරණි මානවයින් හා වර්තමාන මිනිසාගේ සම්භවය, පුරාණ දේශගුණය, වඳවී ගිය සතුන්, ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් භාවිතා කළ මෙවලම්, පැරණි මිනිසුන්ගේ දඩයම් ක්‍රමෝපායයන්, පැරැණ්නන්ගේ අභිචාර විධි සහ පළඳනා, පැරණි සුසාන ක්‍රම, මිනිසා පරිසරයට දැක්වූ සම්බන්ධතාවය ආදිය පිළිබඳව අධ්‍යයනය කිරීම වේ. එසේම එම අධ්‍යයන තුළින් වර්තමානයේ ජීවත් වන සතුන්ගේ පූර්වජයන් පිළිබඳ කරුණු අධ්‍යයනය මෙන්ම පුරාණයේ එම සතුන් වඳ වීමට හේතු වූ සාධක, වර්තමාන ජෛවවිවිධත්වය සංරක්ෂණය කිරීමට පිටුවහලක් වේ.

පාඨමාලාවේ කාලය - මාස 12
පාඨමාලාවේ ආරම්භය - **2024** සැප්තැම්බර්
අවම ප්‍රවේශ සුදුසුකම් - අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස්පෙළ සමත්වීම හෝ පර්යේෂණ පළපුරුද්ද
පාඨමාලා මාධ්‍ය - සිංහල/ඉංග්‍රීසි
දේශන පැවැත්වීම - දේශන සෑම සෙනසුරාදා දිනකම පෙ.ව.**9.30** සිට ප.ව. **4.30** දක්වා
පාඨමාලාව විෂයන් 06 කින් හා විභාග වාර 02 කින් සමන්විතය.

**අයදුම්පත් ලබාගැනීම හා පාඨමාලා පිළිබඳ වැඩි විස්තර http://pgiar.kln.ac.lk යන වෙබ් අඩවියෙන් හෝ 011 2 66 78 85/077 100 39 34 යන දුරකථන අංකයෙන් ලබාගත හැකිය**